මෙම කොටස සඳහා වෙනම පිළිතුරු පොතක් භාවිත කළ යුතු ය. එහි විෂය ලෙස ලිවිය යුත්තේ **"ව්‍යාපාර නීතිය"** යන්න පමණි.

සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අන්තර්මධ්‍ය විභාගය - 2012 ජනවාරි**

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

2012-01-29
පස්වරු
[2.00 – 3.30]

**ව්‍යාපාර නීතිය**

(Business Law)

**කාලය: පැය 1 විනාඩි 30 යි.**

පිටු ගණන: 02
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

*(1) මෙම ප්‍රශ්න පත්‍රය **ව්‍යාපාර නීතිය හා කළමනාකරණය** යන විෂයයේ **ව්‍යාපාර නීතිය** කොටස යි.*

*(2) **ඕනෑම ප්‍රශ්න පහක (05) ට උත්තර ලියන්න.***

*(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාළව, එක් **භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*

*(4) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය විෂයය සමත් වීම සඳහා, අයදුම්කරුවකු, ව්‍යාපාර නීතිය මෙන්ම කළමනාකරණය යන එක් එක් කොටසට, අවස්ථාවෝචිත පරිදි, 40% හෝ 50% බැගින් වූ අවම ලකුණු මට්ටමක් ලබාගත යුතු ය.*

*(5) ලකුණු 50.*

---

**01.** (a) වෘත්තීය සමිතියක් පිහිටුවීමට අයිතිවාසිකමක් නොමැති නිලධාරීන් වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

(b) කරුණු වරදවා දැක්වීම මත නීතිමය පියවර ගැනීම සඳහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා දෙකක්(02) සඳහන් කරන්න.

(c) වාණිජ මහාධිකරණයට සිය අධිකරණ පාත්‍රතාව (අධිකරණ බලය) ක්‍රියාත්මක කළ හැකි කාරණා දෙකක්(02) සඳහන් කරන්න.

(d) චාරිත්‍රයක් නීතියක් ලෙස පිළිගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා දෙකක්(02) සඳහන් කරන්න.

(e) විනිශ්චයක පූර්වගමනය / අධිකරණ තඩු තීන්දු (judicial precedents) අදාල කර ගැනීම සඳහා සපුරා ලිය යුතු කරුණු දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 10)

**02.** X, **ABC සමාගමේ** සේවකයෙකි. විෂමාචාරය පිළිබඳ අසත්‍ය චෝදනා මත සමාගම X ගේ සේවය අවසන් කර ඇත. තවද සේවක අර්ථසාධක අරමුදලට (EPF) X වෙනුවෙන් දායක මුදල් ගෙවීමද සමාගම විසින් පැහැර හැර ඇත.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් X ට ඇති නෛතික ප්‍රතිකර්මද, ලබාගත හැකි සහනද පිළිබඳව ඔහුට උපදෙස් දෙන්න.

(a) අසත්‍ය විෂමාචාර චෝදනා මත සේවය අවසන් කිරීම. (ලකුණු 05)

(b) සමාගම විසින් සේවක අර්ථසාධක දායක මුදල් ගෙවීම පැහැර හැරීම. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

**03.** (a) ගිවිසුම් නීතිය අනුව වලංගු ගිවිසුමක තිබිය යුතු අත්‍යාවශ්‍ය අංග කවරේද? (ලකුණු 06)

(b) ගිවිසුමක් අවසන් කළ හැකි ප්‍රධාන ක්‍රම මොනවාද? (ලකුණු 04)

(මුළු ලකුණු 10)

**04.** "නියෝජ්‍යත්ව නීතිය යටතේ නියෝජිතට මෙන්ම ප්‍රධානියාටද යුතුකම් (duties) රැසක් පැවරේ".

නියෝජිතයාගේ සහ ප්‍රධානියාගේ යුතුකම් වෙන වෙනම සාකච්චා කරන්න. (ලකුණු 10)

**05.** (a) **A,** හිස් චෙක්පතක් අත්සන් කොට *"ගනුදෙනු කළ නොහැක"* යනුවෙන් රේඛනය කරයි. අනතුරුව කාර්යාලයේ මාසික ගෙවල් කුලිය ගෙවීම සඳහා චෙක්පතේ මුදල සහ ආදායකයාගේ නම සම්පූර්ණ කිරීම පිණිස **A** චෙක්පත තම ලිපිකරුට භාර දෙයි. ලිපිකරු විසින් චෙක්පත සම්පූර්ණ කර ඔහු විසින් ලබා ගන්නා ලද ණය මුදලක් පියවීම සඳහා එම චෙක්පත **B** ට භාර දෙයි. **A** එය දැනගත්විට එම චෙක්පතේ ගෙවීම නතර කරන ලදී.

චෙක්පත සම්බන්ධයෙන් **A** ගේ වගකීම සාකච්ජා කරන්න. (ලකුණු 06)

(b) චෙක්පත *"ආදායකයාගේ ගිණුමට පමණි"* යනුවෙන් රේඛනය කර ඇති අවස්ථාවක බැංකුවේ වගකීම සාකච්ජා කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

**06.** "භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ මිල නොලත් විකුණුම්කරුට ගිවිසුම කඩකර ඇති ගැනුම්කරුවෙකුට එරෙහිව ක්‍රියත්මක කළ හැකි එක් ප්‍රතිකර්මයක් වන්නේ ලියමේ බලයයි (right of lien)".

(i) ඉහත කී ප්‍රතිකර්මය ක්‍රියාත්මක කළ හැකි වන්නේ කවර අවස්ථාවන් යටතේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ඉහත කී ප්‍රතිකර්මය ක්‍රියාත්මක කළ **නොහැකි** වන්නේ කවර අවස්ථාවන් යටතේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

\- o0o -